**කලවාන ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවලට අදාල මුද්දර ගාස්තු ඌන බිල්කිරීම් රු. 14,328,326 ක් සඳහා ගැලපුම් කර නොතිබුණු අතර, ඊට අදාලව ලැබී තිබුණු රු. 25,343,536 ක් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | ඉකුත් වර්ෂ වලට අදාල මුද්දර ගාස්තු ඌන බිල්කිරීම් සඳහා ගැලපුම් කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශය සකස් කිරීමේ දී නිවැරදි කරමි. |
| (ආ) | පළාත් සභා අරමුදලින් ඉටු කරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු රු. 6,898,694 ක් හා ගෙවිය යුතු එකතුව රු.3,930,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල උපචිත ප්‍රාග්ධන ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව ක්‍රියා කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 1,849,290 ක් වූ ප්‍රාග්ධන වියදම් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කුලියට දී නොතිබුණු කඩකාමර 33 ක් වෙනුවෙන් රු. 1,038,000 ක ආදායමක් බිල්කර තිබුණි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට වග බලා ගන්නා බව දන්වමි. |
| (ඉ) | ඉකුත් වර්ෂවලට අදාල උසාවි දඩ ඌන බිල්කිරීම් රු. 263,084 ක් සඳහා ගැලපුම් කර නොතිබූ අතර, ලැබී තිබූ උසාවි දඩ රු. 1,190,125 ක් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | ඉකුත් වර්ෂ වලට අදාල උසාවි දඩ ඌන බිල්කිරීම් සඳහා ගැලපුම් කළ යුතුවේ. | උසාවි දඩ ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් රු. 84,231 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ මෝටර් බෝට්ටුවේ වටිනාකම රු. 73,505 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මිලදීගත් වත්කම් වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කරන බව දන්වමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ පුස්තකාල පොත් රු. 58,300 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මිලදීගත් වත්කම් වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කරන බව දන්වමි. |
| (එ) | ගිණුම් විෂයයන් 11 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 34,061,916 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | වෙනස්කම් වලට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඒ) | එකතුව රු. 258,361 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාල ප්‍රමාණවත් සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ එකතුව රු. 12,893,776 ක් වටිනා පොදු තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල කාලයට නියමිත ලේඛන පරීක්ෂා කර නිශ්චිතවම ගෙවන ලද ගෙවීම් හඳුනාගෙන මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 03 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව කළ යුතුවේ. | අළුත්වැඩියා කටයුතු සිදුකළ වහාම ඉන්ධන පරීෂාව සඳහා යොමු කරන බව දන්වමි. |
| (ඇ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභියාට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | අන්තර්ජාලය හරහා සේවාවන් සඳහා අයදුම්පත් ලබා ගැනීමේ හැකියාව සලසා ඇති බවත්, තවදුරටත් මෙම සේවාව පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතින බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 38,918,876 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 260 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,514,000 | 3,346,428 | 3,495,201 | 3,712,885 | 3,385,155 | 3,257,175 | 3,523,564 | 3,187,549 |
| කුලී | 7,779,700 | 5,827,127 | 4,702,597 | 6,256,572 | 3,200,250 | 5,299,846 | 5,132,945 | 5,108,105 |
| බලපත්‍ර ගාස්තු | 601,815 | 554,093 | 555,293 | - | 528,680 | 481,940 | 481,940 | - |
| වෙනත් ආදායම් | 12,749,550 | 12,317,621 | 13,326,159 | 23,495,799 | 4,872,300 | 8,848,245 | 13,442,412 | 13,893,730 |
| | 24,645,065 | 22,045,269 | 22,079,250 | 33,465,256 | 11,986,385 | 17,887,206 | 22,580,861 | 22,189,384 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| වසර 03 ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 719,652 ක් වූ වරිපනම් ඒකක 121 ක හිඟය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | දේපල තහනම් කිරීමේ වැඩසටහන් මඟින් 2019 වර්ෂය තුල රු. 286,365 ක් අයකරගෙන ඇති බව දන්වමි. |
| **(ආ) අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 195,786 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 191 කින් අයවිය යුතු රු. 167,764 ක් ඇතුලත් වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු සතොයක්ෂණයක් සිදුකර ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 1,060,321 ක් වූ අතර, මුද්දර ගාස්තු රු. 4,765,090 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුවේ. | අදාල ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල මසකට කසළ ටොන් 110 ක් පමණ ජනනය වුවද, එම කසළ කළමනාකරණය සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | රැස් කරන දිරන කසළ බිම් පිරවුමක් හා නොදිරන ද්‍රව්‍ය පිළිස්සීමක් සිදුකරන බව දන්වමි. කසළ කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලා ඇති ප්‍රතිපාදන ලද පසු කසළ කළමනාකරණ කටයුතු විධිමත්ව සිදුකිරීමට බලාපොරොත්තු වන බව දන්වමි. |

#### (ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කුකුළේ ගඟ ආශ්‍රිතව මෝටර් බෝට්ටු සේවාවක් ආරම්භ කිරීම සහ ආපදා අවස්ථා වලදී ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් රු. 791,730 ක් වැයකර බෝට්ටුවක් මිලදී ගෙන තිබුණද, බෝට්ටු සේවාව ආරම්භ කර නොතිබුණි. | සභාව සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | සංචාරක කර්මාන්තය සඳහා යෙදවීමේ අරමුණින් මෝටර් බෝට්ටුව මිලදී ගත්තද, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබුනු බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ බවත් ඉදිරියේදී ආපදා තත්ත්වයන්හීදී භාවිතා කිරීමට යෝජනා වී ඇති බවත් දන්වමි. |

## 3.2 වත්කම් කළමනාකරණය

### 3.2.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගර්භිත තත්ත්වයේ පවතින වාහන 02 ක් අපහරණය කර නොතිබුණි. | ගර්භිත වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ගර්භිත තත්ත්වයේ පවතින අත් ට්‍රැක්ටරය හා මාර්ග තලනය 2019 භාණ්ඩ සමීක්ෂණයේදී වෙන්දේසි කිරීම සඳහා නිර්දේශ කර ඇති බව දන්වමි. |

### 3.2.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයෙහි නිර්දේශ සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ යාවත්කාලීනව ක්‍රියාත්මක කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල නිර්දේශ ප්‍රකාරව අබලි භාණ්ඩ වෙන්දේසිය 2020 ජූලි 01 දිනට සිදු කිරීමට නියමිතය. |

## 3.3 ප්‍රසම්පාදනය

### 3.3.1 සැපයුම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් සංවර්ධනය කිරීම සඳහා තෝරාගෙන තිබූ මාර්ග 05 කට අවශ්‍ය ABC මිශ්‍රණ සැපයීම වෙනුවෙන් 2018 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලදී රු. 827,650 ක් වැයකර තිබුණි. එහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ද්‍රව්‍ය සපයා ගෙන තිබූ අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කල බව පෙන්වීම සඳහා ව්‍යාජ ලේඛන පිළියෙල කර තිබුණි. | වැඩ, භාණ්ඩ හා සේවා සපයා ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සිදුකළ යුතු අතර, සභා අරමුදල් වැයකර සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීමේදී සැලසුම්සහගතව හා ඵලදායී ලෙස කටයුතු කළ යුතුවේ. | මෙම මාර්ග දැඩි ලෙස අබලන්ව හා මඩ සහිතව පැවති අතර මාර්ග භාවිතා කරන මහ ජනතාවගේ දැඩි ඉල්ලීම් නිසා ඉතා කඩිනමින් කළයුතු කාර්යයක් සේ සලකා ඒ වනවිට සභාව සතුව පැවති අරමුදල් ප්‍රමාණය ද සලකා බලා සභාව විසින් ගන්නා ලද තීරණය අනුව ABC ඇතිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ බව දන්වමි. |

### 3.3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | | |
| --- | --- | --- |
| වේවැල්කඳුර දොඩංවල මාර්ගය සංවර්ධනය සඳහා භාවිතා කිරීමට 2019 සැප්තැම්බර් 25 දින තාර බැරල් 19 ක් නිකුත් කර තිබූ නමුත්, 2020 ජූනි මස අවසන් වනවිටත් අදාල මාර්ගය සංවර්ධනය කර නොතිබූ අතර, ඒ සඳහා සකස් කල ඇස්තමේන්තුවක් හෝ විගණනය වෙත ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත් විය. | කර්මාන්ත සඳහා ද්‍රව්‍ය නිකුත් කිරීම අනුමත ඇස්තමේන්තුවකට අනුව කර්මාන්තය ක්‍රියාත්මක කරන කාල වකවානුව තුල සිදුකල යුතුවේ. | මෙම දිනවල පවතින වර්ෂා තත්ත්වය හේතුවෙන් තාර දැමීමේ කටයුතු සිදු කිරීම අපහසු බැවින් තාර අතුරා දැමීම සිදු කරන තුරු තාර බැරල්වල වගකීම ගමේ සමිතියකට භාර දීමට කටයුතු කරන බව දන්වමි. |